# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07


**30.09.2011**

## පුවත්පත් නිවේදනය

29.09.2011 දින රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ හදිසි මධ්‍යම කාරක සභා රැස්වීමේදී පහත සඳහන් තීරණවලට එළඹුනි.

1. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය රටේ නීතියට ගරු කරන සංවිධානයකි. එහෙයින් අප රටේ නීතිය පිළිබඳව උපරිම විශ්වාසයෙන් කටයුතු කරනු ලබන අතර ඕනෑම අපක්ෂපාති පරීක්ෂණයකට පෙනීසිටීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකයන් වශයෙන් අප සූදානමින් සිටිමු.

2. සායනික සේවයේ යෙදෙන වෛද්‍යවරුන් කිසිදු මුදල් ගණුදෙනුවක නොයෙදෙන අතර රෝගී සත්කාරය හැර ඔවුන්ගේ දිනපොත් හා ලිපි ලේඛනවල වෙනත් කිසිදු සටහනක් නොමැති නිසා මුදල් පරිහරණය සම්බන්ධ චෝදනා ඔවුනට අදාළ නැත.

3. විදේශගත පුහුණු කාලයේදී නිවාඩු සම්බන්ධව යම් ගැටළුවක් වේනම් ඒ සඳහා වහාම දෙපාර්තමේන්තු මට්ටමේ අපක්ෂපාති පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

4. උසස් අධ්‍යාපන අමාත්‍යවරයෙකුට නොගැළපෙන අයුරින් අශිෂ්ඨ භාෂා විලාසයකින් යුතු මෙම පුද්ගලයාගෙන් රටේ වෘත්තියවේදීන්ට එල්ල වන මෙම තර්ජන අප සංගමය දැඩි ලෙස හෙළා දකින අතර රටේ වෘත්තියවේදීන්ට ඔහු මෙන් අශිෂ්ඨ අන්දමින් හැසිරිය නොහැකි බවද දන්වා සිටිමු.

මේ සම්බන්ධව අප සංගමයේ විරෝධතාවය පළකරමින් 04.10.2011, දින දිප ව්‍යාප්ත වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයට අවතීර්ණ වීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තීරණය කර ඇත.

වෛද්‍ය චන්දික එපිටකඩුව,
ලේකම්.

වැඩිදුර විස්තර -: වෛද්‍ය උපුල් ගුණසේකර - 0716841272
වෛද්‍ය සංකල්ප මාරසිංහ - 0714486770